2022.07.01

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති
ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා,
ජනාධිපති කාර්යාලය,
කොළඹ.

අතිගරු ජනාධිපතිතුමනි,

**දේශපාලනික හා ආර්ථික ස්ථාවරත්වයක් තුළින් ජන ජීවිත සුරක්ෂිත කිරීමට වහා ක්‍රියාත්මක විය යුතු යි**

රට තුළ පවතින දේශපාලනික හා ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් මහජනතාව මුහුණ දෙන දැඩි දුෂ්කරතා පිළිබඳවත් මහජන විශ්වාසය දිනාගනිමින් එකී අර්බුද විසඳීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් ගත වූ කාලය තුළ අවස්ථා කිහිපයක දී ඔබතුමන් දැනුවත් කිරීමට අප විසින් කටයුතු කරන ලදී. එකී යෝජනා මාලාව ප්‍රකාරව උද්ගතව ඇති අර්බුද විසඳීම සඳහා සාධනීය පියවර ගන්නා බව ඔබතුමන් විසින් අප වෙත ලිඛිත දැන් වූ මුත් එකී අර්බුද සඳහා සැබෑ විසඳුම් සෙවීම පසෙකලා සුපුරුදු පක්ෂ දේශපාලන න්‍යාය පත්‍රය මත ක්‍රියාත්මක වීම පිළිබඳ අපගේ අප්‍රසාදය පළ කරමු.

සීඝ්‍රයෙන් ඉහළ යන ජීවන වියදම හමුවේ පීඩනය දරාගත නොහැකි මහජනතාව මුහුණ දෙන දුක් ගැහැට දිනෙන් දින ඉහළ යමින් පවතී. අත්‍යාවශ්‍ය ආහාර, ඖෂධ හා ඉන්ධන සපයා ගැනීමේ දුෂ්කරතාවෙන් හෙම්බත්ව සිටින මහජනතාව ස්වකීය මූලික ජීවන අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට අසමත්ව දැඩි මානසික පීඩාවකට ලක්ව සිටී. රාජ්‍ය නායකයා ලෙස අප විසින් ඉදිරිපත් කරන ලද යෝජනා මාලාවන්ට ආරම්භයේදී ම යම් නම්‍යශීලී භාවයක් ඔබතුමන් දැක් වූයේ නම් රට තුළ මෙවන් අරාජිකත්වයක් නිර්මාණය නොවනු ඇති බව අපගේ විශ්වාසය යි.

තව ද, නිශ්චිත සාර්ව ආර්ථික සැලැස්මක් නොමැතිව කටයුතු කිරීම හේතුවෙන් අද වන විට ශ්‍රී ලංකාව අසමත් රාජ්‍යයක් බවට පත් වී අවසන් ය. විධායකය හා ව්‍යවස්ථාදායකය මෙම අර්බුදයේ කොටස් කරුවන් බව මහජනතාවගේ චෝදනාව යි. විධායකය හා ව්‍යවස්ථාදායකය එක්ව රට තුළ සිදු වූ හා සිදු වන දූෂණ වංචා වළක්වා නීතියේ ආධිපත්‍ය ස්ථාපිත කිරීමට කටයුතු නොකිරීම රට තුළ නිර්මාණය වී ඇති වත්මන් අරාජිකත්වයට හේතුව බව මේ වන විට ප්‍රත්‍යක්ෂ වී අවසන් ය.

එමෙන් ම දේශපාලනික අස්ථාවරත්වය හමුවේ ජනතාව විධායකය හා ව්‍යවස්ථාදායකය මත තබා ඇති විශ්වාසය ද දැඩි සේ හීන වී ඇත. මෙම මොහොතේ ජනතා ගැටලු සඳහා නිසි පිළිතුරු සැපයීම වෙනුවට ජනතා විරෝධය නොසලකා මර්දනකාරී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීම එල්ල වන ජනතා විරෝධය තව දුරටත් තීව්‍ර කිරීමට හේතු වනු ඇත. තව ද රජය පිළිබඳ දැඩි මහජන විරෝධතාවක් එල්ලවන මෙවන් මොහොතක ජාත්‍යන්තර ආධාර ලබා ගැනීම ද දැඩි අර්බුදයකට පත්ව ඇත.

එහෙයින් තවදුරටත් මහජන පීඩාවන් පිළිබඳ අසංවේදී ව පටු, ආත්මාර්ථකාමී දේශපාලන න්‍යාය පත්‍රයන්හි එල්බ නොසිට, අර්බුදයේ හේතු වටහාගෙන තනතුරු, බලය, වරප්‍රසාද පසෙක ලා ජනතාවගේ ජීවත් වීමේ අයිතිය සුරක්ෂිත කිරීම උදෙසා ඉදිරිපත් වීම සෑම මහජන නියෝජිතයෙකුගේ ම යුතුකම හා වගකීම විය යුතුය. ඒ සඳහා වත්මන් පාලන තන්ත්‍රය සමත් නොවන්නේ නම් රට තුළ දේශපාලනික ස්ථාවරත්වයක් ඇති කොට ආර්ථික අභියෝගයන්ට සාර්ථකව මුහුණ දිය හැකි විද්වත් පිරිසකට රටේ රාජ්‍ය පාලනය භාර දීමට කටයුතු කිරීම ජනතාවාදී මහජන නියෝජිතයන් විසින් ගත යුතු වඩාත් කාලෝචිත පියවරයි.

22 වන ව්‍යවස්ථා සංශෝධනය වහා සම්මත කොට ආර්ථික ස්ථාවරත්වයක් රට තුළ ඇති කොට මහජනතාව වෙත කඩිනම් සහන සැලසීම සඳහා නිශ්චිත කෙටි කාලීන පොදු අවම වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීමට රාජ්‍ය නායකයා ලෙස නැවතත් සියලු පක්ෂ නායකයින් කැඳවා නිර්ව්‍යාජ සර්ව පාක්ෂික ආණ්ඩුවක් පත්කර ගැනීමට ඔබතුමන් පියවර ගත යුතු බව අපි තරයේ අවධාරණය කරමු. නිර්මාණය වී ඇති සමාජ අසහනය හා මහජන පීඩාවන් පිළිබඳ සංවේදීව එකඟතා සහිතව හෝ සියලු පක්ෂ නායකයින් යම් නිශ්චිත කාලයකට මහජන සුභසිද්ධිය උදෙසා එක්ව කටයුතු කිරීම කාලෝචිත ය. තව ද එකී සර්ව පාක්ෂික ආණ්ඩුව පිහිටුවීමේ දී ගරු ජනාධිපතිතුමන් හා සියලු පක්ෂ නායකයින් පහත යෝජනාවන් පිළිබඳ එකඟතාව ඇති කර යුතු ය.

1. සර්ව පාක්ෂික ආණ්ඩුවේ කර්යභාරය හා කාල සීමාව මාස 06 කට සීමා කොට එකී කාල සීමාව තුළ මහජන පීඩාවන් අවම කොට ආර්ථික ස්ථාවරත්වයක් ඇති කිරීමට සර්ව පාක්ෂික රජය සමත් වන්නේ නම් පමණක් අවශ්‍යතාව අනුව එම කාල සීමාව මාස 12 කට හෝ 18 කට සියලු පක්ෂ නායකයින්ගේ එකඟත්වය මත දීර්ඝ කර ගැනිම. එසේ නොමැති නම් අවසාන විසඳුම ලෙස නව ආණ්ඩුවක් පත් කර ගැනීමට මහජනතාවට ඉඩ ප්‍රස්ථාව විවර කර දීම.
2. සර්ව පාක්ෂික ආණ්ඩුවේ ප්‍රධානියා ලෙස පක්ෂ නායකයෙකු පත් කර ගැනීමට සියලු පක්ෂ අතර එකඟත්වයක් නොවන්නේ නම් සියලු පක්ෂ නායකයින් එකඟ වන එම වගකීම දැරීම සඳහා යෝග්‍ය ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පරිණත වියත් බුද්ධිමත් නිර්පාක්ෂික ශ්‍රී ලාංකේය පුරවැසියෙකු ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත් කර ගැනීම.
3. සර්ව පාක්ෂික ආණ්ඩුවේ අමාත්‍ය මණ්ඩලයේ සමාජිකත්වය උපරිමය 15 කට සීමා කළ යුතු අතර දූෂණ චෝදනාවන්ට වරදකරු වී ඇති කිසිවෙකු අමාත්‍ය ධූරයකට පත් නොකිරීම.
4. ඒ ඒ අමාත්‍යාංශ විෂය පථයන්ට අදාළ වගකීම් දැරීමට වෘත්තීමය සුදුසුකම් හා පළපුරුද්ද ඇති අය පමණක් තෝරා පත් කර ගත යුතු අතර එවන් සුදුසුකම් සැපිරූ පුද්ගලයෙකු පාර්ලිමේන්තුව තුළ නොවන්නේ නම් පක්ෂ නායකයින්ගේ එකඟතාව මත ශ්‍රී ලාංකේය පුරවැසියෙකු ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත් කර ගැනීම.
5. 2022.04.04 දිනැතිව අප විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු යෝජනා මාලාවේ දැක්වෙන පරිදි, එකී සර්ව පාක්ෂික අන්තර්කාලීන පාලනයට අවශ්‍යය උපදෙස් හා මාර්ගෝපදේශයන් ලබා ගැනීමට විශේෂඥ උපදේශක මණ්ඩලයක් (ජාතික බුද්ධි මණ්ඩලයක්) පත් කර ගැනීම.
6. එකී විශේෂඥ මණ්ඩලය විසින් යෝජනා කරනු ලබන අන්තර්කාලීන පාලන වැඩ පිළිවෙළ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කොට පක්ෂ නායකයන්ගේ එකඟත්වයෙන් පක්ෂ දේශපාලනයෙන් තොරව ජාතික ප්‍රතිපත්තියක් මත පිහිටා ක්‍රියාත්මක වීම.

7. ආර්ථික අර්බුදය විසඳීම සඳහා විශේෂඥ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා විනිවිද භාවයකින් යුක්තව විධිමත්ව සිදුවන බව නිරන්තරයෙන් පසු විපරම් කිරීම සඳහා ස්වාධීන කමිටුවක් පත් විය යුතු අතර එකී ක්‍රියාවන් අධිකරණයේ ප්‍රශ්න කිරීමට යටත් විය යුතු අතර විධිමත් විගණනයට භාජනය කර මහජනතාවගේ දැන ගැනීම පිණිස කලින් කලට ප්‍රසිද්ධ කිරීම

8. මෙම කාලය තුළ ජනාධිපතිවරයා හා සර්ව පාක්ෂික ආණ්ඩුවේ අග්‍රාමාත්‍යවරයා එකී මණ්ඩලයේ සාමූහික තීන්දු තීරණවලට අනුගතව ක්‍රියාත්මක වීමට බැඳී සිටීම.

9. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මෙන් ම අමාත්‍ය මණ්ඩලයේ වර ප්‍රසාද අහෝසි කොට අවදානම් ආර්ථික මට්ටමේ සිටින ජනතාවට සහන සැලසීමට අවශ්‍යය නෛතික ප්‍රතිපාදන වහා සකස් කිරීම.

10. රාජ්‍ය සම්පත් අනිසි කළමනාකරණයෙන් රට අරාජික කිරීම වෙනුවට අන්තර් ජාතික ආයතන හා මිත්‍ර රටවල් සම්බන්ධීකරණය තුළින් ණය ආධාර ලබා ගැනීම හා කළමනාකරණය සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කිරීම.

මහජන සුභසිද්ධිය අරමුණු කරගත් මෙකී යෝජනා මාලාව පිළිබඳ ඔබතුමන්ගේ කඩිනම් අවධානය යොමු කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු. රට තුළ දේශපාලන ස්ථාවරත්වය ඇති කොට ආර්ථික අභියෝගයන්ට සාර්ථකව මුහුණ දී ඉහළ යන ජීවන වියදම අවම කොට මහජන ජීවිත සුරක්ෂිත කිරීමට විධායකය හා ව්‍යවස්ථාදායකය අසමත් වන්නේ නම්, තවදුරටත් මහජන පීඩාවන් උග්‍ර නොකොට ඒ සඳහා හැකියාවක් ඇති විද්වත් පිරිසකට රාජ්‍ය පාලනය භාර දීම සමස්ත ලංකාවාසීන්ගේ ප්‍රශංසාවට හේතු වනු ඇති බව අපගේ විශ්වාසය යි.

එසේ නොමැතිව ආර්ථික අර්බුදය හමුවේ අසරණව සිටින මහජනතාව කෙරෙහි අසංවේදීව පක්ෂ දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කරන්නට උත්සහ දරන සියලු දේශපාලනඥයන් ප්‍රතික්ෂේප කිරීමට මහජනතාව කටයුතු කරනු ඇත.

එහෙයින් උද්ගතව ඇති සමාජ-ආර්ථික අර්බුදයන් කඩිනමින් විසඳා ජන ජීවිත සුරක්ෂිත කරන්නට වහා කටයුතු කළ යුතු බව අවධාරණයෙන් යුතුව දන්වා සිටිනු කැමැත්තෙමු.

ඒ වගත් මෙසේ ම,

අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන
මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ
මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහානායක ස්ථවිර,
මල්වතු මහාවිහාරය, මහනුවර.

අතිපූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී
පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන
මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ
අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ මහානායක ස්ථවිර,
අස්ගිරි මහාවිහාරය, මහනුවර.

අතිපූජ්‍ය දොඩම්පහළ ශ්‍රී චන්ද්‍රසිරි අභිධාන
ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ උත්තරීතර මහානායක ස්ථවිර,
ගෝතම තපෝවනය,
කලපලුවාව, මුල්ලේරියාව,
නව නගරය.

අතිපූජ්‍ය මකුලෑවේ ශ්‍රී විමලාභිධාන
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකායේ මහානායක ස්ථවිර,
මිණිඔළුව විද්‍යාවාස මහපිරිවෙණ,
මීරිගම.